සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ජුදයේ බෙත්ලෙහෙම් නම් නුවර කිතු උපත සිදුවීම මගින් ඉටු වූයේ දෙවි සමිඳාණන් කා හට දුන් පොරොන්දුවද?
    (1) යෙසායා ට (2) ස්නාවක ජොහාන් ට
    (3) දාවිත් ට (4) ජනතාව ට

02. දිවැසිවර යෙසායා ප්‍රකාශ කරන පරිදි ධර්මිෂ්ඨකමෙන් යුත් තැනැන්වහන්සේ රජ වන්නේත්, සියල්ලේ උපදේශකයා වන්නේත්,
    (1) බලයනේ හා සාධාරණත්වයෙන් ය. (2) සාධාරණත්වයෙන් හා ධර්මිෂ්ඨකමෙන් ය.
    (3) බලයෙන් හා යුක්තියෙන් ය. (4) යුක්තියෙන් හා සාධාරණත්වයෙන් ය.

03. මරන්න ගෙන යන බැටළුවකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටළුවකු මෙන්ද යන ශුද්ධ ලියවිලි පාඨයෙන් ප්‍රකාශ කරන ජේසුස් වහන්සේගේ සේවකත්වය පිළිබඳ පහදා දුන්නේ,
    (1) පිලිප් විසින් ඉතියෝපීය නපුන්සකයාට ය. (2) යෙසායා විසින් ජනතාවට ය.
    (3) පිලිප් විසින් ජනතාවට ය. (4) දාවිත් විසින් ජනතාවට ය.

04. 'මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත.' මෙම දේව දූත පණිවිඩයට බැහැපත්ව ප්‍රතිචාර දැක්වූයේ,
    (1) එලිසබෙත් ය. (2) සෙකරියස් ය. (3) මරියතුමිය ය. (4) ජෝසෙප් ය.

05. සිමියොන් යන නමේ අර්ථය වන්නේ,
    (1) දෙවියන් වහන්සේ ඇසූ සේක යන්න යි. (2) දෙවියන් වහන්සේ අප සමඟය යන්න යි.
    (3) දෙවියන් වහන්සේ මුදන සේක යන්න යි. (4) දෙවියන් වහන්සේගේ ප්‍රශංසාව ලැබීය යන්න යි.

06. ජුදෙව් බලාපොරොත්තුව වූ මෙසියස් වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටි ජනයාට එම සිදුවීම ආසන්න බව දැනගන්න හැරියේ,
    (1) අරුම පුදුම ලකුණු තුළින් ය.
    (2) ස්නාවක ජොහන්තුමා පෙරමඟ දූත කාර්ය ඉටු කිරීම තුළින් ය.
    (3) දිවැසිවර ප්‍රකාශ තුළින් ය.
    (4) අධිරාජ්‍යයා විසින් ජනතාවට පීඩාවට පත්කිරීම තුළින් ය.

07. ජුදෙව් ආගමික ජනතාව තම පියාණන් ලෙස හඳුනා ගත්තේ,
    (1) ආබ්‍රහම් ය. (2) දෙවියන් වහන්සේ ය.
    (3) ජේසුසු වහන්සේ ය. (4) මෝසෙස් ය.

08. මෙසියස් වහන්සේ හා දේව රාජ්‍යය තමන් සතුබව විශ්වාස කළේ,
    (1) අන්‍ය ජාතීන් ය. (2) ජුදෙව්වනරුන් ය.
    (3) ඉශ්‍රායෙල් ජනතාව ය. (4) පූජකවරු ය.

09. පව්කරුවන් සහමුලින් ම ප්‍රතික්ෂේප කිරීමේ ජුදා ආකල්පය ජේසුස් වහන්සේ වෙනස් කිරීමට ක්‍රියා කළ බව පසක් කිරීමට ගත හැකි උදාහරණයක් වන්නේ,

(1) සාකෙවුස් පිළිගැනීම ය. (2) කුදු ස්ත්‍රීයට සුවය ලබා දීමය.

(3) සීමොන්ගේ නිවසේ දී පාද සේදූ ස්ත්‍රීය පිළිගැනීම ය. (4) නිකදේමුස් පිළිගැනීම ය.

10. ශ්‍රාවකයන් අතර විවාදයේ දී ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දීමට ජේසුස් වහන්සේ යොදාගත් ක්‍රියාශීලී උපමාව වන්නේ,

(1) කුඩා දරුවන් ය. (2) මුතු ඇටයක් ය.

(3) මුහුන් ය. (4) වැන්දඹු කාන්තාවන් ය.

11. 'පුත්‍රය නුඹේ පව් නුඹට කමා කරන ලදී.' යනුවෙන් ප්‍රකාශ කරමින් සුවය දානය කළේ,

(1) ලාදුරු රෝගියාට ය. (2) සුදර්ශන දොරටුව අසල සිටි කොරාට ය.

(3) අංශභාග රෝගියාට ය. (4) වියලි අතක් ඇති මිනිසාට ය.

12. 'මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයකි. ඔබ එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ.' ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,

(1) පව්කරුවන්ට ය. (2) ජනතාවට ය. (3) පරිසිවරුන්ට ය. (4) සද්දුසිවරුන්ට ය.

13. ජේසුස් වහන්සේ ඔලිව කන්දේ කළ යාච්ඤාව තුළින් පිළිඹිබු වන්නේ,

(1) දේව කැමැත්තට කීකරුව දුක්විදීම හා මරණය පිළිගත්බව ය.

(2) දේව කැමැත්ත පිළිගත් බව ය.

(3) දුක් විඳීම කැමැත්තෙන් භාරගත් බව ය.

(4) යාච්ඤාව ප්‍රබල කරගත් බව ය.

14. ජුදෙව් ආගමික නීතිය අනුව චෝදනා විභාග කර තීන්දුව දෙනු ලැබුවේ,

(1) අධිකරණයෙනි. (2) උසාවියෙනි.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයෙනි. (4) ධර්මශාලාවෙනි.

15. ජනතාව විසින් ජේසුස් වහන්සේ කුරුසිපත්කරන ලෙස ඉල්ලීම තුළින් ඔවුන් ප්‍රතික්ෂේප කරන ලද්දේ,

(1) දේව රාජ්‍යය තුල ලද හැකි විමුක්තිය ය. (2) සාධාරණත්වය ය.

(3) ජුදා බලාපොරොත්තුව ය. (4) දිවැසිවර අනාවැකි ය.

16. පරීක්ෂාවන් පැමිණෙන විට ඇදහිල්ලෙන් ශක්තිමත් වීමට ඇති මාර්ගය වන්නේ,

(1) පව්කමාකර ගැනීම ය. (2) යාච්ඤාව ය.

(3) හඬා වැලපීම ය. (4) ප්‍රශංසා කිරීම ය.

17. ජේසුස් වහන්සේ දෙස බලා හඬා වැලපෙන ස්ත්‍රීයන්ට එසේ නොහඬන්න යැයි පැවසීම තුළින් පසක් කරන්නේ,

(1) තම කුරුසි පූජාව අමිල වූ දෙයක් බව ය.

(2) තම කුරුසි පූජාව ගැලවීමට මාර්ගය බව ය.

(3) තම කුරුස පූජාව පරාජයක් නොව විජයග්‍රහණයක් බව ය.

(4) තම කුරුසි පූජාව සාධාරණ බව ය.

18. පහත චරිත හඳුනා ගන්න.

A ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙක් වුවද ජුදෙව් ක්‍රියා කලාපය අනුමත නොකළ අයෙකි.

B ඇලෙක්සැන්ඩර්ගේ ද රූපස්ගේ ද පියා ය.

C අවසානයේදී තම වරද පිළිගෙන ජේසුස් වහන්සේ තම දිවියේ ගැලවුම් කරු ලෙස පිළිගත්හ.

හඳුනාගත් ඉහත චරිත ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පිළිවෙලින් සම්බන්ධ වූ වරණයට අයත් අක්ෂර වන්නේ,

(1) BCA ය. (2) ACB ය. (3) ABC ය. (4) CAB ය.

19. ජුදෙව් ජනයා වාර්ෂිකව පැවැත්වූ පාස්කුව හැඳින්වීමට භාවිතා කළ තවත් නමක් වන්නේ,

(1) පෙන්තකොස්ත මංගල්‍යය. (2) කූඩාරම් මංගල්‍යය.

(3) අස්වනු මංගල්‍යය. (4) නුමුහුන් රොටී මංගල්‍යය.

20. දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව් ජනතාව අවධි කිරීමට කළ සංකේතාත්මක ක්‍රියාව වන්නේ,

(1) රාජ තේජසින් ජෙරුසලමට පැමිණීම ය. (2) දේව මාලිගාව පවිත්‍ර කිරීම ය.

(3) අන්තිම රාත්‍රී භෝජනය පැවැත්වීම ය. (4) ඔලිව් කන්දේ යාච්ඤා කිරීම ය.

21. මළවුන්ගෙන් උත්ථාන වූ ජේසුස් වහන්සේගේ ජීවමානව වැඩ විසීමට සාක්ෂිකරුවන් වන්නේ උන්වහන්සේ...

(1) ළඟින්ම සිටි ශ්‍රාවක පිරිස සහ අනුගාමික පිරිස ය.

(2) ඥාතීන් සහ හිතවතුන් ය.

(3) කුරුසිපත්කළ හේවායන් ය.

(4) නායක පූජකයන් සහ උත්තම පූජක කායාපස් ය.

22. එම්මාවුස් ගමනට සහභාගි වූ ශ්‍රාවකයින් දෙදෙනා ජීවමාන සමිඳාණන් පිළිබඳ තම අත්දැකීම අන් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කළේ,

(1) සමිඳාණෝ අපට මුණ ගැසුන සේක යනුවෙන් ය.

(2) සමිඳාණෝ අපට කථා කල සේක යනුවෙන් ය.

(3) ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක යනුවෙන් ය.

(4) සැබැවින්ම සමිඳාණන් වහන්සේ අපත් සමඟ ගමන් කල සේක යනුවෙන් ය.

23. ජුදෙව් සමාජය තුළ ගින්න සංකේතවත් කරනු ලැබුවේ,

(1) ආලෝකය විහිදුවා ලීමේ මූලය ලෙස ය. (2) දේව අභිමුකත්වය හා බලය ලෙස ය.

(3) අපවිත්‍ර දේ දවාලන ශක්තිය ලෙස ය. (4) අඳුර දුරුකර හරින ශක්තිය ලෙස ය.

24. ස්නාවක ජොහාන්තුමාගේ සේවය හා තමන් වහන්සේගේ සේවයේ ඇති සබඳතාවය පෙන්වීමට ජේසුස් වහන්සේ කළ කාර්ය වන්නේ,

(1) ස්නාවක ජොහාන්තුමා ගැන ජනතාවට පැවසීම ය.

(2) ස්නාවක ජොහාන්තුමාගේ සේවය අගය කිරීම ය.

(3) ස්නාවක ජොහාන්තුමාගේ සේවය විවේචනය කිරීම ය.

(4) ස්නාවක ජොහාන්තුමාගේ බෞතීස්මය ලැබීම ය.

25. බෞතීස්ම ස්නාපනය ලැබූ ජේසුස් වහන්සේ නික්ම ගියේ,

(1) පාළුකරයට ය. (2) ජොර්දාන් මිටියාවතට ය.

(3) කඳු මුදුනට ය. (4) තම නිවසට ය.

26. ලෞකික ආශාවන් කෙරෙහි යොමු වීමට ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාව වන්නේ,

(1) පළමු පරීක්ෂාව ය. (2) දෙවන පරීක්ෂාව ය.

(3) තුන්වන පරීක්ෂාව ය. (4) කුරුසියේ සොරාගෙන් පැමිණි පරීක්ෂාව ය.

27. ජේසුස් වහන්සේගේ උත්තානයෙන් හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයින්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ උන්වහන්සේගේ,

(1) මෙලොව පහළ වීම ය. (2) බෞතීස්ම ස්නාපනය ය.

(3) පරීක්ෂාවන්ට මුහුණ දීම ය. (4) රූප විපර්යාසය ය.

28. දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව ජේසුස් වහන්සේ වදාළ උපමා කථා දෙකක් වන්නේ,

(1) අබ ඇටය සහ වපුරන්නා ය. (2) වපුරන්නා සහ නැතිවූ බැටළුවා ය.

(3) අබ ඇටය සහ තලෙන්ත ය. (4) තලෙන්ත සහ නැතිවූ බැටළුවා ය.

29. දේව බලය කෙරෙහි තිබූ මවිත කර ඇදහිල්ල ගැන ජේසුස් වහන්සේගේ ඇගයීමට ලක් වූයේ,

(1) කොරනේලියස් ය. (2) සාකෙවුස් ය.

(3) කපර්ණවුවමෙහි ශතාධිපතියා ය. (4) රෝම ආණ්ඩුකාරයා ය.

30. ජේසුස් වහන්සේ සොබා දහම අභිබවා දේව බලය ලකුණු දැක්වූ වැදගත් අවස්ථාවක් වන්නේ,

(1) අංශභාග රෝගියා සුව කිරීම ය. (2) පන්දහසකට කන්න දීම ය.

(3) ලාදුරු රෝගියා සුව කිරීම ය. (4) ලාසරුස් මරණින් නැගිටුවීම ය.

31. ජේසුස් වහන්සේ වදාළ මහා මංගල භෝජනය පිළිබඳ උපමාවේ දෙවන වර කැඳවනු ලැබූවන් වන්නේ,
(1) පරිසිවරුන්, සද්දූසිවරුන්, දිළින්දන්, කොරුන් ය.
(2) විනයදරයන්, දිළින්දන්, සද්දූසිවරුන්, අන්ධයන් ය.
(3) පරිසිවරුන්, විනයදරයන්, සද්දූසිවරුන්, පූජකවරුන් ය.
(4) දිළින්දන්, අබ්බගාතයන්, අන්ධයන්, කොරුන් ය.

32. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති අපේක්ෂණ දක්වන උපමා කථා වන්නේ,
(1) නැති වූ බැටළුවා, නැති වූ කාසිය, නැති වූ පුත්‍රයා ය.
(2) නැති වූ බැටළුවා, කමා නොවූ දාසයා, නැති වූ කාසිය ය.
(3) කමා නොවූ දාසයා, නැති වූ පුත්‍රයා, යහපත් සමාරිතයා ය.
(4) නැති වූ පුත්‍රයා, යහපත් සමාරිකයා, නැති වූ බැටළුවා ය.

33. දේව රාජ්‍යයේ වර්ධනය සඳහා ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම අවශ්‍ය බව පෙන්වීමට ජේසුස් වහන්සේ වදාළ උපමා කථාව වන්නේ,
(1) පොහොසත් මෝඩයාගේ උපමා කථාවයි. (2) යහපත් සමාරිතයාගේ උපමා කථාවයි.
(3) වංචනික ගබඩාකාරයාගේ උපමා කථාවයි. (4) කමා නොවූ දාසයා පිළිබඳ උපමා කථාවයි.

34. දේව රාජ්‍යයේ පුරවැසියකු තම හැකියාවන් අන් අය වෙනුවෙන් සේවයේ යෙදවීම පිළිබඳ ජේසුස් වහන්සේ වදාළ උපමා කථාව වන්නේ,
(1) නැති වූ බැටළුවා පිළිබඳ උපමාව ය. (2) තලෙන්ත පිළිබඳ උපමාව ය.
(3) වපුරන්නාගේ උපමාව ය. (4) මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව ය.

35. සිය කැමැත්තෙන් ජේසුස් වහන්සේගේ අනුගාමිකයකු වීමට අවසර ඉල්ලූ පුද්ගලයා උන්වහන්සේගෙන් ලැබුවේ,
(1) අනුගාමිකයකු වීමේ වාසි දැක්වීමේ පිළිතුරකි.
(2) අනුගාමිකයන්ට එල්ලවන පීඩා දැක්වීමේ පිළිතුරකි.
(3) අනුගාමිකයන්ට හිමිවන ගරුබුහුමන් දැන්වීමේ පිළිතුරකි.
(4) අනුගාමිකත්වයේ භාරදූරකම දැක්වීමේ පිළිතුරකි.

36. දේව රාජ්‍යයේ පුරවැසියන් නිහතමානී විය යුතු බව පෙන්වීමට ජේසුස් වහන්සේ සිදුකළ ආදර්ශමත් ක්‍රියාව වන්නේ,
(1) ශ්‍රාවකයින්ගේ පාද සේදීම ය. (2) පවුකාර ස්ත්‍රීයට කමාව දීම ය.
(3) සාකෙවුස්ගේ නිවසට යාම ය. (4) ලාදුරු රෝගියා සුවපත් කිරීම ය.

37. ජේසුස් වහන්සේ පොහොසත් මෝඩයා පිළිබඳ උපමා කථාවෙන් උගන්වන්නේ,
(1) ලෞකික වස්තුව ගැන කරදර වීම පිළිබඳව ය.
(2) පොහොසත් වීමේ උත්සහ කිරීම මෝඩකමක් බව ය.
(3) අයුතු ලෙස ධනවත් වීමට උත්සහ කිරීම පිළිබඳ ව ය.
(4) ධනවත් වීමට උත්සහ නොකළ යුතු බව ය.

38. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමේ මොහොතට සූදානම් වන ලෙස දැන්වීමට ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,
(1) අවසන් මොහොත පැමිණ තිබේ යනුවෙනි.
(2) ඔබේ ඉඟ පටිය බැඳ පහන් දල්වා තබා ගන්න යනුවෙනි.
(3) ඔබේ ඇදහිල්ල නොබිඳෙන පිණිස යාච්ඤා කරන්න යනුවෙනි.
(4) නියමිත මොහොත තවම පැමිණ නැත යනුවෙනි.

39. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව කිතුනු අප අපේ සතුරන් කෙරෙහි,
(1) වෛරය පැතිරවිය යුතු ය. (2) සාමය පැතිරවිය යුතු ය.
(3) ප්‍රේමයෙන් මෙත්සිත් වැඩිය යුතු ය. (4) නීතියෙන් දඬුවම් ගෙන දිය යුතු ය.

40. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් මත ජීවිතය ගොඩනගා ගන්නා ඥානවතකු බව පෙන්වීමට උන්වහන්සේ වදාළ උපමාව වන්නේ,
(1) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව ය. (2) අත්තික්කා ගස පිළිබඳ උපමාව ය.
(3) මුහුන් පිළිබඳ උපමාව ය. (4) අත්තිවාරම් දෙක පිළිබඳ උපමාව ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) දෙවියන් වහන්සේ විසින් තෝරාගත් දිවැසිවරුන්ට පැවරුණු කාර්යයන් දෙකක් ලියන්න.

(ii) රෝම අධිරාජ්‍යයට යටත්ව තිබූ ප්‍රදේශ දෙකක් ලියන්න.

(iii) ප්‍රායෝගිකව පුහුණු කිරීම සඳහා ජේසුස් වහන්සේ ශ්‍රාවකයින් සඳහා සූදානම් කළ ධර්මදූත චාරිකා දෙක සඳහන් කරන්න.

(iv) මාගේ මෑණියොත් සහෝදරයෝත් නම් මාගේ වචනය අසා ඒවා පිළිපදින්නෝ වෙති. මෙයින් අදහස් කරන අර්ථය කුමක්ද?

(v) ජේසුස් වහන්සේ අවසාන රාත්‍රී භෝජනය අවස්ථාවේදී රොටියක් අතට ගෙන තුති පුදා කඩා බෙදා දෙමින් ප්‍රකාශ කළ වදන් ලියා දක්වන්න.

(vi) ඔබ මා කවුරුන් කියා සිතන්නහුද? යන ජේසුස් වහන්සේගේ පැනයට පිළිතුරු දුන්නේ කවුද? කෙසේද?

(vii) රූප විපර්යාසයේ තේජශ්‍රීය අත්දුටු ශ්‍රාවකයන් තිදෙනා ජේසුස් වහන්සේට කළ යෝජනාව කුමක්ද?

(viii) වපුරන්නාගේ උපමාවේ බීජ වැටුණු තුන්වන සහ සිව්වන ස්ථාන වලින් ප්‍රකාශ වන ඉගැනීම් ලියා දක්වන්න.

(ix) මහා මංගල භෝජනය පිළිබඳ උපමාවේ පළමුව ආරාධනය ලැබූ අය එය ප්‍රතික්ෂේප කිරීමට දැක්වූ හේතු දෙකක් ලියා දක්වන්න.

(x) ජුදෙව් වැසියන්ගේ විශ්වාසය හා අදහස අනුව දුෂ්ඨකම් හා පාපය නිසා මිය ගියා යයි පවසන ජන කණ්ඩායම් දෙක සඳහන් කරන්න. (ල. 2x10=20)

02. (i) ස්නාවක ජොහාන් තුමා තම සේවය සඳහා සූදානම් වූ ආකාර දෙකක් ලියන්න.

(ii) ස්නාවක ජොහාන් තුමා තම දූත කාර්යය තුළ ජනතාව වෙනුවෙන් කළ සේවාවන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ස්නාවක ජොහාන් තුමාගේ පූර්වාදර්ශය තුළ ඔබට දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා කළ හැකි සේවාවන් පහක් විස්තර කරන්න. (ල. 2+3+5=10)

03. (i) රෝම අධිරාජ්‍යය ජුදෙව්වන් පීඩාවට පත් කළ ආකාර දෙකක් ලියන්න.

(ii) වත්මන් සමාජයේ සාමාන්‍ය ජනයා පීඩනයට පත්කරන අවස්ථා තුනක් උදාහරණ සහිතව දක්වන්න.

(iii) නීති රීති හා ව්‍යවස්ථාව තුළින් ජනතාව පීඩාවට පත්කරන විට එයට විරුද්ධව ජේසුස් වහන්සේ කළ ක්‍රියාවන් මගින් එම නීති අභියෝගයට ලක්කල අවස්ථා (විවිධ ක්ෂේත්‍ර තුළ) පහක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 2+3+5=10)

04. (i) 'දාවිත්ගේ පුත්‍රයාණෙනි, මට අනුකම්පා කළ මැනව.' යි කියමින් ජේසුස් වහන්සේට මොර ගැසුවේ කෙබඳු අයෙක්ද?

(ii) සිය ශ්‍රද්ධාව නිසා දේව බලය අත්දුටු ඔහුගේ ප්‍රතිචාරය කෙබඳුදැයි ලියා දක්වන්න.

(iii) දේව බලය පිළිබඳ විශ්වාසය තුළ ඔබ සුවය අත්දුටු අවස්ථාවක් පිළිබඳව වාක්‍ය පහකින් ලියා දක්වන්න. (ල. 2+3+5=10)

05. (i) දේව රාජ්‍යයේ නායකත්වය දැරීම පිළිබඳ ජේසුස් වහන්සේ ලබාදුන් උපදෙස් දෙකක් ලියා දක්වන්න.

(ii) ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක්වූ අවස්තා තුනක් ලියා දක්වන්න.

(iii) කිතුනු දරුවකු ලෙස ඔබ සේවක නායකත්ව ලක්ෂණ විදහාපාන අවස්ථා පහක් විස්තර කරන්න. (ල. 2+3+5=10)

06. (i) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමට සූදානම් වීම පිළිබඳව කළ ප්‍රකාශය දෙකක් සඳහන් කරන්න.

(ii) උන්වහන්සේ පැමිණෙන විට දකින්නට කැමති වූ දේවල් තුනක් ලියා දක්වන්න.

(iii) කිතුනු දරුවකු ලෙස ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමට ඔබ සූදානම් වන්නේ කෙසේදැයි වාක්‍ය පහකින් පැහැදිලි කරන්න. (ල. 2+3+5=10)

07. පහත සඳහන් මාතෘකා දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

(i) කුළුඳුලන් කැප කිරීම.

(ii) ප්‍රථම ශ්‍රාවකයන් කැඳවීම.

(iii) දුක්ප්‍රාප්තියට ප්‍රතිචාර දැක්වූවන්

(iv) ජේසුස් වහන්සේගේ බෞතීස්මය (ල. 5+5=10)

**10 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය 2019** | **ක්‍රිස්තු ධර්මය**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3) | 02. (4 ) | 03. ( 1) | 04. (3 ) | 05. (1 ) | 06. (2 ) | 07. (1 ) | 08. (2 ) | 09. (3 ) | 10. ( 1) |
| 11. (2 ) | 12. (4 ) | 13. ( 1) | 14. (2 ) | 15. (1 ) | 16. (2 ) | 17. (3 ) | 18. (1 ) | 19. (4 ) | 20. ( 2) |
| 21. (1 ) | 22. (3 ) | 23. ( 2) | 24. (4 ) | 25. (2 ) | 26. (2 ) | 27. (4 ) | 28. (1 ) | 29. (3 ) | 30. ( 2) |
| 31. (4 ) | 32. (1 ) | 33. ( 3) | 34. (2 ) | 35. (4 ) | 36. (1 ) | 37. (1 ) | 38. (2 ) | 39. (3 ) | 40. ( 4) |

(ල. 40)

## II පත්‍රය

01 (i) දේවානුභාවයෙන් යුත් වචනය ජනයාට පිළිගැන්වීම. / අඳමිටුබවින් ජනතාව මුදවා ගැනීම.
(ii) ජුදය, ගලීලය, ඉතුරය, ත්‍රිකෝනිය, අධිලේනය
(iii) ශ්‍රාවකයන් දොළොස්දෙනා පිටත්කර යැවීම. / ධර්මදූතයන් හැත්තෑදෙනා පිටත්කර යැවීම.
(iv) දෙවියන් වහන්සේගේ කැමැත්ත තේරුම් ගෙන එය ඉටු කරන අය දේව පවුලේ සමීප සබඳතාවයට ඇතුළත් වෙති.
(v) ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය. මා සිහිවන පිණිස මෙය සිදු කරන්න.
(vi) පේදුරු, ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය.
(vii) මණ්ඩප තුනක් සාදාගෙන කඳු මුදුනේ විසීමය.
(viii) තුන්වන අවස්ථාව - සම්පූර්ණයෙන් ඵල නොදරයි.
සිව්වන අවස්ථාව - සම්පූර්ණයෙන් ඵල දරයි.
(ix) ගොන් පස් බානක් මිලදී ගැනීම, කෙතක් මිලදී ගැනීම, ස්ත්‍රියක් විවාහ කර ගැනීම.
(x) හෙරොද් රජු විසින් මරා දමනු ලැබූ ගලීලයන් සීලොවම් බලකොටුව වැටී ඊට යට වී මියගිය ජෙරුසලම් වැසියන් 18 දෙනා. (ල. 2x10=20)

02. (i)
- වනයේ සරල දිවි පෙවතක් ගත කිරීම.
- යාච්ඤාවෙන් කාලය ගත කිරීම.
- භාවනාවෙන් කාලය ගත කිරීම. (ල. 02)

(ii)
- පව් කමා කිරීමේ මනස්ථාපනයට කැඳවීම.
- පව් කමා කිරීමේ බාහිර සංකේතය වන ජෝර්දාන් ගඟේ ගිල්වා බව්තිස්ම කිරීම.
- වේගවත් දේශනා මගින් ජනතාව දැනුවත් කිරීම. (ල. 03)

(iii) ස්නාවක ජොහාන් තුමාගෙන් ගත හැකි ආදර්ශ අනුව කළ හැකි සේවාවන් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 05)

03. (i)
- අධික ලෙස බදු අයකිරීමෙන්
- රෝම හේවායන්ගේ බඩු මිටිය සැතැප්මක් දුර ගෙනයාමට බල කිරීමෙන් (ල. 02)

(ii) සිසුන් වත්මන් සමාජය උදාහරණයට ගෙන ලියා ඇති පිළිතුරුවලටට ලකුණු දෙන්න. (ල. 03)

(iii)
- රෝග සුව කිරීම
- පව්කරුවන් පිළිගැනීම.
- ව්‍යවස්ථාව (ජුදා නීතිය) හරය ගෙනහැර පෑම, කළ ක්‍රියා (සබත පිළිබඳ) ආදි ජේසුස් වහන්සේ කළ ක්‍රියා ඇසුරින් උදාහරණ ලියා ඇත්නම්, ඕනෑම උදාහරණයක් විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 05)

04. (i) ජෙරිකෝවේ අන්ධ මිනිසා (ල. 02)
(ii) දෙවියන් වහන්සේට ප්‍රශස්සා කරමින් දේව බලය පිළිබඳව අන් අයට සාක්ෂිකරුවකු වීම. (ල. 03)
(iii) පෞද්ගලික අත්දැකීමක් අනුව සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

05. (i)
- ශ්‍රේෂ්ඨ තැනැත්තා ඉතා සුළු තැනැත්තා විය යුතුය.
- නායකයා සේවකයා විය යුතුය.
- අන් අය කෙරෙහි බලය නොපෑයුතුය. (ල. 02)

(ii)
- කුඩා දරුවන් අගය කිරීම.
- සේවය අවශ්‍ය අය වෙත ගොස් සේවය කිරීම.
- ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
- අන් අයගේ ගැලවීම උදෙසා ජීවිතය පිදීම. (ල. 03)

(iii)
- තම හැකියාවන් අන්අය වෙනුවෙන් සේවයේ යෙදවීම.
- උදව් අවශ්‍ය අයට උදව් කිරීම වැනි ජේසුස් වහන්සේගේ ආදර්ශයන් අනුව ලියා ඇති කරුණු බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

06. (i) විශ්වාසදායක දාසයෝ, විශ්වාසී සහ අවිශ්වාසී දාසයෝ. (ල. 02)

(ii)
- සෑම විටම උන්වහන්සේ සේවය කිරීම.
- උන්වහන්සේගේ දාස දාසයන්ට නිසිලෙස සැලකීම.
- තම ලෞකික ආශාවන් උන්වහන්සේ වෙනුවෙන් කැප කිරීම.
- ජේසුස් වහන්සේගේ කැමැත්ත හා වචනය අනුව සංවිධානාත්මක හා වගකීම් සහිත සේවයක් ඉටු කිරීම. (110-119 පිටුව) (ල. 03)

(iii)
- දේව කැමැත්ත දැන එය ඉටු කිරීම.
- විශ්වාසී දාසයකු මෙන් කටයුතු කිරීම වැනි ලියා ඇති කරුණු බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

07. (i) 10 ශ්‍රේණිය - 17 පිටුව
(ii) 10 ශ්‍රේණිය - 30 පිටුව
(iii) 10 ශ්‍රේණිය - 67 - 69 පිටුව
(iv) 10 ශ්‍රේණිය - 76 - 77 පිටුව (ල. 5+5=10)